**බෙන්තොට ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

## 01. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 05 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2. මතය

මෙම වාර්තාවේ ඇතුළත් මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමග මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සභාව සතු මෝටර් රථයේ වටිනාකම වූ රු.650,000 ක් ගිණුම්වලින් අත්හැර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.36,000 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන ගිණුම් ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී දරන ලද රු.18,040 ක් වූ පුනරාවර්තන වියදම් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන වැය ලෙස සටහන් කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල වැය ශීර්ෂයෙන් මිලදී ගත් ද්‍රව්‍ය තොගයේ රු.115,131 ක් වූ ඉතිරි තොගය ජර්නල් 52 මගින් පොදු ගබඩා ගිණුමට රු.115,131 ක් ලෙස හර කර, ප්‍රාග්ධන වැය ගිණුමට රු.151,131 ක් ලෙස බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම රු.36,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2010 දෙසැම්බර් 31 දිනට එකතුව රු.78,156,783 ක් වූ හර ශේෂ 27 ක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ශේෂ පිරික්සුමේ බැර ශේෂයන් ලෙසද, බැර ශේෂයන් 18 ක් ශේෂ පිරික්සුමේ හර ශේෂයන් ලෙසද දක්වා තිබුණි. එමෙන්ම ශේෂ පිරික්සුම පොත් තැබීමේ නිලධාරි, ලේකම් සහ සභාපති විසින් අත්සන් කර සහතික කර තිබුණි.

### 1.3.3 නිරවුල් නොකළ ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට රු.245,861 ක් වූ පෙර ගෙවුම් ශේෂය තුළ අවුරුදු 03 සිට අවුරුදු 17 ක් දක්වා වූ කාලපරිච්ඡේදයක් තුළ නිරවුල් නොකර, ඉදිරියට ගෙන එමින් පවතින රු.108,500 ක ශේෂයන් ද විය. එකී ශේෂයන් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

### 1.3.4 නොසැසඳූ පාලන ගිණුම්

බෙන්තොට ප්‍රධාන කාර්යාලයීය ආයුර්වේද තොගයේ ඖෂධ වර්ග 4 කට අදාලව පාලන ගිණුම් අනුව ශේෂය රු.14,323 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂය රු.50,531ක් වීමෙන් වෙනස රු.36,208 ක් විය.

### 1.3.5 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 03 ක කාලය ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,197,587 ක් විය. මෙම ශේෂය තුළ වර්ෂ 10 කට වඩා පැරණි රු.721,312 ක ශේෂයක් ද විය.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

#### (අ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.34,987,574 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

#### (ආ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2010 දෙසැම්බර් 31 දින වනවිට නිකුත් කර වර්ෂ 06 ඉක්ම වූ විගණන විමසුම් 08 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළහැකි ගණුදෙනුවල වටිනාකම රු.427,425 ක් විය.

1.3.7 **නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | | **අනුකූල නොවීම්** |
|---|---|---|
| **(අ)** | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | |
| (i) | රීති අංක 193 | අයවැය සමග වැය විෂයයන් සඳහා අතිරික්ත හා ඌණතාවලට හේතු දැක්වෙන ප්‍රකාශයක් සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පිළියෙල කර, විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | රීත අංක 194 | ලී බඩු ඇතුළු සභාවේ සෑම දේපලක්ම ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි. |
| (iii) | රීති අංක 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කර වාර්තා කර නොතිබුණි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි (මු.රෙ.)** | |
| | මු.රෙ.756 හා 757 | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

02. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ප්‍රාදේශීය සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.116,759 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,669,891 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 3,911 | 3,048 | 2,413 | 3,825 | 3,367 | 1,753 |
| බදුකුලී | 2,492 | 2,487 | 43 | 2,201 | 3,360 | 40 |
| බලපත්‍ර ගාස්තු | 643 | 622 | 128 | 618 | 593 | 129 |
| වෙනත් ආදායම් | 23,129 | 24,348 | 9,127 | 24,047 | 19,306 | 10,012 |

### 2.2.2 හිඟ ආදායම් අයකර නොගැනීම

සමාලෝචිත වර්ෂය අවසානයට රු.15,763,141 ක හිඟ ආදායම්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති ප්‍රකාර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 02 ක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර, පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.267,400 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.2.4 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.7,780,388 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම් අදාල විචලනයන් ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 17,006 | 16,520 | 486 | 16,593 | 15,920 | 673 |
| අනෙකුත් | 10,961 | 14,337 | (3,376) | 11,255 | 11,208 | 47 |
| උප එකතුව | 27,967 | 30,857 | (2,890) | 27,848 | 27,128 | 720 |
| ප්‍රාග්ධන වියදම | 4,512 | 7,422 | (2,910) | 4,841 | 6,925 | (2,084) |
| මුළු එකතුව | 32,479 | 38,279 | (5,800) | 32,689 | 34,053 | (1,364) |

## 2.4 මානව සම්පත් කළමණාකරනය

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 03 | 01 |
| ද්විතීයක | 19 | 20 |
| ප්‍රාථමික | 27 | 19 |
| වෙනත් (අනියම්/තාවකාලික) | - | 39 |

2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමණාකරන සේවා චක්‍රලේඛය අනුව ස්ථිර / තාවකාලික / අනියම් / ආදේශක/ කොන්ත්‍රාත් හෝ වෙනත් කිසියම් පදනමක් මත බඳවා ගැනීම කරනු ලබන්නේ නම් ඒ සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගතයුතු බව දන්වා තිබුණ ද, එලෙස අනුමැතිය ලබා නොගෙන සභාව විසින් ද්විතීයක ශ්‍රේණියේ එක් නිලධාරියෙකු සහ ආදේශක, අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 39 දෙනකු බඳවා ගෙන සේවයේ යොදවා තිබුණි.

## 2.5 වත්කම් කළමණාකරනය

### 2.5.1 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

(අ) කැනේඩියානු රජය විසින් 2007 මාර්තු 19 දින සභාවේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා පරිත්‍යාග වශයෙන් ලබා දී තිබූ රු.196,150 ක් වටිනාකම වූ කසල කැබලි කරන යන්ත්‍රය, අත් ට්‍රැක්ටරය හා කොම්පෝස්ට් හලන යන්ත්‍රය අදාල ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම නිසා විගණිත දිනය වූ 2011 ජුනි 08 දින වනවිටත් භාවිතයකින් තොරව නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) සභාවට අයත් අගය රු.2,458,385 ක් වූ , ගොඩනැගිලි 03 ක් සහ ට්‍රැක්ටරයක් අවුරුදු 02 සිට අවුරුදු 06 දක්වා වූ කාලයක් තුල නිශ්ක්‍රීයව පැවතුණි.

### 2.5.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.2,104,745 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.72,075 ක් විය.

## 2.6 හඳුනාගත් පාඩු

බෙන්තොට, ඉඳුරුව සහ පහලගම්භය පුස්තකාලවල වටිනාකම රු.14,999 ක් වූ පොත් 1415ක ඌණතාවයක් විය. එමෙන්ම ඉඳුරුව පුස්තකාලයෙන් 2005 වර්ෂයට පෙර බැහැර දෙන ලද වටිනාකම රු.10,376ක් වූ පුස්තකාල පොත් 107 ක් ද නැවත භාර දී නොතිබුණි.

## 2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභාවේ කිසිදු මන්ත්‍රීවරයෙකු විසින් 2010 වර්ෂයට අදාල වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

(ආ) සභාවේ සේවකයෙකු වෙත රාජ්‍ය බැංකුවක් විසින් දී තිබූ දේපල ණය මුදල් වෙනුවෙන් 2007 අප්‍රේල් මස සිට 2010 දෙසැම්බර් දක්වා රජයේ පොලී දායකය ලෙස සභා අරමුදලින් ගෙවා තිබූ රු.234,176 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූරණය කරවාගෙන නොතිබුණි.

## 2.8 කොන්ත්‍රාත් පරිපාලනය

### (අ) අත්හැර දැමූ ව්‍යාපෘති

**බෙන්තොට සාප්පු සංකීර්ණය ඉදිකිරීම සහ ගෝනගල සාප්පු සංකීර්ණය සහ එළවළු වෙළඳ කුටිය ඉදිකිරීම.**

බෙන්තොට සාප්පු සංකීර්ණය ඉදිකරම, ගෝනගල සාප්පු සංකීර්ණය සහ එළවළු වෙළඳ කුටිය ඉදිකිරීමේ කර්මාන්ත සඳහා පිළිවෙලින් රු.37,838,424 ක් සහ රු.30,704,105 ක ඇස්තමේන්තු සකස් කර, 2009 අපෙල් 21 දින සභා අනුමැතිය ලබාගෙන තබුණි. උපදේශන සේවාවන් වෙනුවෙන් මිළ ගණන් කැඳවීම සඳහා පුවත්පත්වල දැන්වීම් පළ කිරීමට රු.19,868ක් ද, බෙන්තොට පොදු වෙළඳ පොල ඉඩම පවරා ගැනීම සඳහා පොලී මුදල් ලෙස රු.43,711ක් ද සහා අරමුදලින් වැයකර තිබුණ ද, විගණන දින වූ 2011 ජුනි 08 දින වනවිට කර්මාන්ත දෙකම අත්හැර දමා තිබුණි.

### (ආ) සෘජු ශ්‍රමික පදනම මත ඉටුකල කර්මාන්ත

**සෙරන්ඩිබ් නවාතැන් මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම**

මෙම කර්මාන්තයෙහි වැඩ විෂයය 02 යටතේ 1.2.4(3/4") මිශ්‍රණයෙන් 4" ඝනකමට කොන්ක්‍රීට් කිරීම සඳහා කියුබ් 05 කට අවශ්‍ය සිමෙන්ති, ගල්, වැලි යන ද්‍රව්‍ය ඇස්තමේන්තු කර තිබුණු අතර, කාර්මික නිලධාරිගේ අවසන් වැඩ වාර්තාව අනුව ඇස්තමේන්තු කර තිබූ ද්‍රව්‍ය ප්‍රමාණයන්ම කර්මාන්තය සඳහා භාවිතා කල බව සහතික කර තිබුණි. එහෙත් කර්මාන්තය සම්බන්ධයෙන් 2011 ජුනි 01 දින සිදුකල ස්ථානීය පරීක්ෂාවේ දී ලබාගත් මිණුම් අනුව යොදා තිබූ කොන්ක්‍රීට් ප්‍රමාණය කියුබ් 3.73 ක් විය. මේ අනුව කර්මාන්තය සඳහා සිමෙන්ති මලු 23 ක් ද, 3/4" ගල් කියුබ් 1 1/4 ක් ද, වැලි කියුබ් 3/4 ක් ද වැඩිපුර නිකුත් කර තිබුණි. එහි පිරිවැය රු.30,142ක් විය.

### (ඇ) ඉඳුරුව උප කාර්යාල භූමියේ ඉදිකර ඇති පෙර පාසල් ගොඩනැගිල්ල

සභාවට අයත් ඉඳුරුව උප කාර්යාල භූමියෙහි, රාජ්‍ය නොවන සංවිධානයක් විසින් මුළු පිරිවැය මිලියන 5.7 ක ඇස්තමේන්තුවක් මත පෙර පාසල් ගොඩනැගිල්ල 2006 වර්ෂයේ දී ඉදිකර තිබුණ ද, ඒ සඳහා සභාව විසින් ගොඩනැගිලි සැලැස්මක් අනුමත කර නොතිබුණි. එමෙන්ම ඉදිකිරීමට අදාල ලිපි ගොනුවද විගණනයට ඉදිරිපත් නොවුණි. 2011 ජුනි 07 දින සිදුකල ස්ථානීය පරීක්ෂාවේ දී ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණු බවත්, ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ අවසන් කර වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමට සභාව මෙතෙක් කටයුතු කර නොතිබූ බවත් නිරීක්ෂණය විය.

## 2.9 අභ්‍යන්තර විගණනය

-----------------------

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 04. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය